# වීර කැප්පෙටිපොල උතුමාණන්ගේ ගුණ සැමරීම



ශ්‍රීලංකාවේ බොහෝ පිරිස් "1818 නිදහස් අරගලය" හඳුන්වනු ලබනුයේ "1818 කැරැල්ල" ලෙසයි.කැරැල්ලක් යනු රාජ්‍යයකට විරුද්ධව කරනුලබන විප්ලවයකටය.නමුත් 1818 දී සිදුවූයේ තම ජාතියේ නිදහස පිණිස වූ උතුම් සටනකි.තවද 1818 දී අරගලය සිදුවූයේ එන්ගලන්තයේ නම් එය කැරැල්ලක් විය යුතුය.මන්ද එන්ගලන්තය පර සුද්දන්ගේ රාජ්‍යය වුවද ශ්‍රීලංකාව පර සුද්දන්ගේ රාජ්‍යය නොවීමයි.

බූටැවේ රටේ රාළ,කිවුලේගෙදර මොහොට්ටාල ආදී ප්‍රතාපවත් වෙල්ලස්සේ වැසියන්ගෙන් ආරම්භවූ 1818 නිදහස් අරගලයේ නායකත්වයගත් වීර කැප්පෙටිපොල මහ දිසාවේ මැත යුගයේ බිහිවූ අසම ශ්‍රේෂ්ඨ සිංහල බෞද්ධයෙකි. අසම වීරයෙකි.

පරසුද්දන්ගෙන් සිංහල දේශය රැකගැනීම පිණිස නායකත්වය ගත්, රට, ජාතිය, ආගම වෙනුවෙන් අභීතව මරණයට මුහුණදුන් ඒ අභීත විරුවා ජාතියට අහිමිවී ඉල් මස 26 දිනට වසර 190 කි.

අප වෙනුවෙන් දිවි පිදු වීර කැප්පෙටිපොල උතුමණන්ගේ ගුණසැමරීම ජාතිමාමක ඔබේත් අපේත් වගකීමයි.ඒසේම වර්ථමානයේ රටට,ජාතියට, ආගමට එන උවදුරු වලින් ලක්මව රැකගැනීම කැප්පෙටිපොල උතුමාණන්ට කරන ලොකුම උපහාරයයි.

සොයුරු සොයුරියනි,

වීර කැප්පෙටිපොල ආදී අපගේ වීර මුතුන් මිත්තන් රැකගත්

ලක්මව,අද අප

වනසමුද? රැකගමුද?

## හෙළහඬ ශිෂ්‍ය සංගමය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය